# ඉන්දීය බෞද්ධ සංස්කෘතියේ පරිහානිය කෙරෙහි බලපෑ දේශපාලනික සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එච්. එන්. රුවන් චාමර නිශාන්ත[1]

## හැඳින්වීම

සංස්කෘතියක චිරස්ථිතිය හෝ පරිහානිය යනු හුදෙක් එම සමාජ පද්ධතිය තුළ පමණක් සිදුවන ස්වාභාවික පරිණාමීය ක්‍රියාවලියක් නොවේ. එකී යුගයේ ක්‍රියාත්මක වන රාජ්‍ය දෘෂ්ටිවාදය සහ දේශපාලන අධිකාරිත්වයේ හැසිරීම් රටාව මත තීරණය වන්නකි. ක්‍රි.පූ. 6 වන සියවසේ දී භාරතයේ උතුරු කලාපය කේන්ද්‍ර කරගනිමින් භූගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ බෞද්ධ සංස්කෘතිය සමස්ත ශිෂ්ටාචාරයේම චින්තනමය හැඩගැස්ම තීරණය කළ ප්‍රබල සාධකයක් විය. බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව වුව ද බෞද්ධ සංස්කෘතිය සමාජගත කිරීමට භික්ෂු සංඝයාට හා රාජ්‍ය තන්ත්‍රයට හැකි වූ බව අපි දනිමු. ශාසන ඉතිහාසය පරීක්ෂා කිරීමේ දී බුද්ධ පරිනිර්වාණයෙන් සියවසකට ඇවෑමෙන් සිදු වූ නිකාය භේදය ඇසුරෙන් ද මෙතෙක් නොවූ විරූ අයුරින් බෞද්ධ සංස්කෘතිය භාරතය පුරා ප්‍රචලිත වන්නට විය. එමෙන් ම පොදු ජනතාවගේ භක්තිමත්භාවය සහිතව චිරාත් කාලයක් මුළුල්ලේ භාරතීය ජන සමාජය තුළ උද්දීපනයක් තහවුරු කර ගැනීමට බෞද්ධ සංස්කෘතියට හැකියාව තිබූ බව පැහැදිලිය. තත්ත්වය එසේ වුවත්, පසු කාලයේ දී බුදුදහම තමන් උපන් භූමියෙන් සම්පූර්ණයෙන් ම පාහේ අතුරුදන් විය. මෙම අභාග්‍යසම්පන්න තත්ත්වය කෙරෙහි බලපාන ලද හේතු සාධක අභ්‍යන්තර හා බාහිර වශයෙන් බෙදා දැක්විය හැකි ය. මෙම පර්යේෂණයේ දී බාහිර සාධකයන්ට අයත් වන දේශපාලන පසුබිම කෙරෙහි අවධානය යොමු කොට තිබේ. ඒ අනුව භාරතය තුළ සිදු වූ රාජ්‍ය ප්‍රතිපත්තිමය මාරුවීම්, බල අරගල, පාලකයන්ගේ දෘෂ්ටිවාදාත්මක පරිවර්තනයන් සහ බාහිරින් පැමිණි ආක්‍රමණශීලී දේශපාලන ප්‍රවණතාවන් බෞද්ධ සංස්කෘතියේ බිඳවැටීමට බලපෑ ආකාරය මෙහි දී විමසීමට ලක් කෙරේ. එබැවින් ඉන්දියානු බෞද්ධ සංස්කෘතියේ පරිහානිය යනු හුදෙක් ආගමික පිරිහීමක් පමණක් නොව දේශපාලන බල අධිකාරිත්වයේ සිදු වූ ව්‍යුහාත්මක පෙරළියක සෘජු ප්‍රතිඵලයක් බව මෙම පර්යේෂණය මඟින් මූලිකවම අනාවරණය වේ.

## පර්යේෂණ ගැටලුව

භාරතීය සමාජය තුළ භූගෝලීය මෙන් ම ආයතනික වශයෙන් අතිශය ශක්තිමත් පදනමක් ගොඩනගාගෙන තිබූ ඉන්දියානු බෞද්ධ සංස්කෘතිය පසුකාලීනව තමන් උපන් භූමියෙන්ම සහමුලින් ම පාහේ අතුරුදන් වීමට බලපෑ ඓතිහාසික සාධක විමර්ශනය කිරීමේ අවශ්‍යතාව පවතී. විශේෂයෙන් ම චිරාත් කාලයක් මුළුල්ලෙහි මහජන භක්ති ආකර්ෂණය දිනාගනිමින් විකාශනය වෙමින් පැමිණි උසස් ආගමික සංස්කෘතියක් රාජ්‍ය අනුග්‍රහය ගිලිහී යාම, පාලකයන්ගේ බෞද්ධ විරෝධී රාජ්‍ය ප්‍රතිපත්ති සහ බාහිරින් එල්ල වූ ආක්‍රමණශීලී දේශපාලන ප්‍රවණතාවන් හමුවේ මෙතරම් ව්‍යුහාත්මක බිඳවැටීමකට

1 තෙවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. ruwanch1234@gmail.com

ලක්විය හැකි ද? යන්න මෙහි දී විමර්ශනයට ලක් කෙරේ. ඒ අනුව ඉන්දියානු බෞද්ධ සංස්කෘතියේ පරිහානිය කෙරෙහි භාරතීය දේශපාලන පසුබිම සහ රාජ්‍ය යාන්ත්‍රණයේ හැසිරීම් රටාව කෙබඳු බලපෑමක් එල්ල කර තිබේ ද? යන්න විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුවයි.

**පර්යේෂණ අරමුණු**

භාරතීය රාජ්‍ය ප්‍රතිපත්තිමය පරිවර්තනයන් බෞද්ධ සංස්කෘතියේ පරිහානිය කෙරෙහි දායක වූ ආකාරය අනාවරණය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. ඒ යටතේ පාලකයන්ගේ බෞද්ධ විරෝධී දෘෂ්ටිවාදාත්මක පරිවර්තනයන් මඟින් බෞද්ධ ආයතන පද්ධතිය බිඳවැටුණු ආකාරය හඳුනාගැනීමත්, දේශපාලන බල අරගල සහ බාහිර ආක්‍රමණශීලී ප්‍රවණතාවන් බෞද්ධ ආයතනයන්හි පැවැත්ම අඩපණ කිරීමට බලපෑ ආකාරය විශ්ලේෂණය කිරීමත් අපේක්ෂා කෙරේ. එමෙන් ම ඉන්දියානු බෞද්ධ සංස්කෘතියේ අතුරුදන් වීම හුදෙක් ආගමික පිරිහීමක් පමණක් නොව දේශපාලන බල ව්‍යුහයේ සිදු වූ පෙරළියක ප්‍රතිඵලයක් බව ශාස්ත්‍රීයව තහවුරු කිරීම මෙහි පවත්නා අනෙක් මූලික අරමුණයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරමින් සිදු කරනු ලබන පර්යේෂණයකි. ඒ අනුව භාරතීය දේශපාලන පරිසරය විමර්ශනය කිරීම සඳහා ප්‍රාථමික මූලාශ්‍රය මෙන් ම ද්විතීයික මූලාශ්‍රය ද උපයෝගී කරගනු ලබයි. මූලාශ්‍රය අනුසාරයෙන් සපයා ගන්නා ලද දත්ත පර්යේෂණ අරමුණුවලට අනුකූලව ඓතිහාසික සහ විචාරාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ තුලනාත්මකව විග්‍රහ කරනු ලබයි. එහි දී රාජ්‍ය ප්‍රතිපත්තිමය පරිවර්තනයන් සහ බාහිර දේශපාලන ප්‍රවණතාවන් භාරතීය බෞද්ධ ආයතනික ව්‍යුහයේ පැවැත්ම කෙරෙහි බලපෑ ආකාරය ව්‍යුහාත්මකව විමර්ශනයට ලක් කෙරේ.

**පර්යේෂණ ප්‍රතිඵල**

ඉන්දියානු බෞද්ධ සංස්කෘතියේ පරිහානිය යනු හුදෙක් ආගමික අභ්‍යන්තර හීනවීමක් නොව, රාජ්‍ය යාන්ත්‍රණයේ සිදු වූ ව්‍යුහාත්මක පෙරළියක සෘජු ප්‍රතිඵලයක් බව මෙම පර්යේෂණයෙන් අනාවරණය වේ. මෙහි දී මූලික වශයෙන් අශෝක අධිරාජ්‍යයාගේ ආගමික සහනශීලී ප්‍රතිපත්තිය හරහා අන්‍ය ආගමික බලවේගවලට සංවිධානය වීමට අදෘශ්‍යමාන දේශපාලන අවකාශයක් නිර්මාණය වූ බව හඳුනාගත හැකි ය. පසුකාලීනව මධ්‍යම රාජ්‍ය බලය බිඳවැටීමත් සමඟ පුෂ්‍යමිත්‍ර සහ ශශාංක වැනි පාලකයන්ගේ රාජ්‍ය අනුග්‍රහය ලත් සංවිධානාත්මක මර්දනය හමුවේ බෞද්ධ ශාසනික යටිතල පහසුකම් අභ්‍යන්තරයෙන් ම බිඳවැටුනු බව පෙනේ. පර්යේෂණයේ තවත් වැදගත් සොයාගැනීමක් වන්නේ මෙලෙස නිර්මාණය වූ අභ්‍යන්තර රාජ්‍ය විරෝධී ප්‍රවණතාවන් සහ ක්‍රි.ව. 7 වන සියවසේ සිට සිදු වූ බාහිර ඉස්ලාමීය ආක්‍රමණ එකිනෙක බැඳෙමින් නාලන්දා වැනි ප්‍රධාන ශාස්ත්‍රීය කේන්ද්‍රස්ථාන විනාශ කිරීමටත්, ඒ හරහා ක්‍රි.ව. 12 වන සියවස වන විට බුද්ධාගම ඉන්දියාවෙන් මුළුමනින් ම තුරන් වීමටත් එකමුතුව බලපෑ බවයි.

**පර්යේෂණ සාකච්ඡාව**

භාරතීය සමාජ දේශපාලන ඉතිහාසය විමර්ශනය කිරීමේ දී බෞද්ධ සංස්කෘතියේ ආරම්භක වර්ධනය, ව්‍යාප්තිය සහ පසුකාලීන පරිහානිය කෙරෙහි රාජ්‍ය අධිකාරිත්වයේ ප්‍රතිපත්තිමය මාරුවීම් සෘජුවම බලපා ඇති බව මෙම අධ්‍යයනයේ දී අනාවරණය කරගත හැකි විය. බුදුරජාණන් වහන්සේ ධරමාන සමයේදී බුදුදහම විෂයෙහි සුවිශේෂී රාජ්‍ය අනුග්‍රහයක් හිමි විය. එය මෙකී සංස්කෘතික පදනමේ ආරම්භක ශක්තිමත්භාවයට හේතු වූ අතර විශේෂයෙන් ම සමකාලීන පාලකයන් දැක්වූ රාජ්‍ය දායකත්වය ශාසනික ව්‍යුහය භාරතීය සමාජය තුළ මුල් බැස ගැනීමට මහෝපකාරී විය. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව මෙම රාජ්‍ය ප්‍රතිපත්තිය වඩාත් සාර්ථක ලෙස ක්‍රියාවට නැංවෙන්නේ ධර්මාශෝක රජුගේ මෞර්ය රාජ්‍ය පාලන සමය තුළදීය. ධර්මාශෝක රජු විසින් සමස්ත භාරතීය භූමිය පුරාම බුදුදහම ප්‍රචලිත කිරීම සඳහා රාජ්‍ය යාන්ත්‍රණය සම්පූර්ණයෙන් ම මෙහෙයවනු ලැබී ය. එහි දී ක්‍රියාවට නැංවූ විවිධ ආගමික හා සංස්කෘතික ප්‍රතිසංස්කරණ බුදුසමයේ අඛණ්ඩ වර්ධනයට මෙන්ම එය භාරතයේ ප්‍රමුඛතම සංස්කෘතික බලවේගය බවට පත්වීමට ද මූලික අඩිතාලම සැකසීය. කෙසේ වුව ද මෙම ශක්තිමත් ඓතිහාසික පසුබිම පසුකාලීනව දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ ප්‍රතිපත්තිමය පරිවර්තනයන් සහ බාහිර දේශපාලන ප්‍රවණතාවන් හමුවේ ව්‍යුහාත්මක වෙනස්වීම්වලට ලක් විය.

මෙම පසුබිම පිළිබඳ විමර්ශනය කිරීමේ දී ආරම්භයේ සිටම බෞද්ධ පසුබිමට එරෙහි වූ හින්දූන්ගේ ක්‍රියාකාරිත්වය ප්‍රමුඛ සාධකයක් ලෙස සැලකිය හැකි ය. බුද්ධ කාලයේ සිටම බුදුදහමට එරෙහිව නොයෙකුත් ක්‍රියාමාර්ග ගැනීමටත්, අවස්ථානුකූලව නිසි අභියෝග එල්ල කිරීමටත් ඔවුහු කල්යල් බලා සිටි බව ඓතිහාසික සාක්ෂි අනුව තහවුරු වේ. හින්දූන්ගේ මෙම අරමුණු සඵල කර ගැනීමට ක්‍රි.පූ. 2 වන සියවස වන විට නිත්‍ය වශයෙන්ම හැකි වූ බව පෙනේ. මේ සඳහා භාරතීය දේශපාලන පසුබිම ප්‍රබල පිටුවහලක් විය.

විද්වත් මතයට අනුව ධර්මාශෝක අධිරාජයාගේ ආගමික ප්‍රතිපත්තිය බුදුදහමේ වර්ධනයට මෙන් ම එහි පරිහානියට ද එක ලෙස බලපා ඇත. රජු අනුගමනය කළ ආගමික සහනශීලී පිළිවෙත හේතුවෙන් එකල දුර්වල මට්ටමක පැවති හින්දු ආගම මෙන් ම ජෛන සහ ආජීවක වැනි සෙසු ආගම් ද ශීඝ්‍රයෙන් ප්‍රතිසංවිධානය විය. මෙලෙස නැවත බලවත් වූ සෙසු ආගම් තරගකාරී ලෙස බුදුසමයට අභියෝග එල්ල කරන්නට වූ අතර එහි සෘජු බලපෑම එල්ල වූයේ බෞද්ධ සංස්කෘතියට ය. මෙම තත්ත්වය පිළිබඳ විමර්ශනය කළ මොරටුවේ ශාසනරතන හිමියන් පෙන්වා දෙනුයේ භාරතීය බෞද්ධ සංස්කෘතියේ බිඳවැටීමට ප්‍රධාන වශයෙන් ම වගකිව යුත්තේ අශෝක අධිරාජයා බවයි. ඒ අනුව එම දේශපාලනික පසුබිමෙන් උපරිම ප්‍රයෝජන ගත් හින්දූන් බෞද්ධ සංස්කෘතියේ පරිහානිය තහවුරු කිරීමට කටයුතු කර ඇති ආකාරය පැහැදිලි වේ.

පශ්චාත් අශෝක සමයෙහි මිළිඳු සහ කණිෂ්ක වැනි ප්‍රබල පාලකයන් බුදුදහම නංවාලීමට කටයුතු කළ ද ඔවුන්ගේ දේශපාලන බලය එක්තරා ප්‍රදේශයකට පමණක් සීමා විය. මේ හේතුවෙන් ම අනෙකුත් ප්‍රදේශ තුළ හින්දු ආධිපත්‍යය බිඳවැටීමකින් තොරව ඉදිරියට පවත්වාගෙන යාමට අවස්ථාව ලැබුණු බව පැහැදිලිය. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාදේශීය පාලකයන්ගේ දේශපාලන රැකවරණය ලත් හින්දු පූජකවරු බෞද්ධයන්ට

එරෙහිව ඉතා කෲර ලෙස ක්‍රියා කිරීමට පෙළඹුණහ. හියුං සාං භික්ෂුවගේ වාර්තාවල දැක්වෙන පරිදි එකල වේසාලියෙහි ගරාවැටුණු ආරාම මෙන් ම තක්ෂිලාවෙහි පාලුවට හැරදමා තිබූ බෞද්ධ ආරාම විශාල ප්‍රමාණයක් පැවතීමට මෙම දේශපාලනික වටපිටාව සෘජුවම බලපෑවේය. ඒ අනුව මධ්‍යම රාජ්‍ය බලය සීමිත වීම සහ ප්‍රාදේශීය දේශපාලන බලය හින්දු ආධිපත්‍යය සතු වීම ඉන්දියනු බෞද්ධ සංස්කෘතියේ පරිහානිය කෙරෙහි බලපෑ ප්‍රධානතම දේශපාලනික හේතුවක් ලෙස පෙන්වා දිය හැකි ය.

භාරතීය බුදුසමයේ පරිහානිය කෙරෙහි රාජ්‍ය ක්‍රියාකලාපය සහ පාලකයන්ගේ සෘජු මැදිහත්වීම බලපෑ ආකාරය විමර්ශනය කිරීමේ දී බුදුසමයට එරෙහිව දියත් වූ දේශපාලනික මර්දනයන්හි උච්ඡතම අවස්ථාවක් ලෙස ශුංග වංශයට අයත් පුෂ්‍යමිත්‍රගේ පාලන සමය හඳුනාගත හැකි ය. බුදුදහම සහ බෞද්ධ සංස්කෘතිය විනාශ කිරීම අරමුණු කරගනිමින් එකල ක්‍රියාවට නැංවුණු භික්ෂු සංහාරය, රාජ්‍ය අනුග්‍රහය සහිතව දියත් වූ දරුණුතම ආගමික මර්දනයකි. එහි දී භික්ෂූන් වහන්සේලා ඝාතනය කිරීම වෙනුවෙන් රාජ්‍ය අණක් පවා නිකුත් කිරීමට පාලකයා කටයුතු කර තිබේ. "යමෙක් මට ශ්‍රමණ හිසක් ගෙනත් දෙන්නේ නම් ඔහුට දීනාර සියයක් දෙන්නෙමි" (යෝ මේ ශ්‍රමණ ශීර්ෂා දාස්‍යාති තස්‍යාහං දීනාර ශතං දාස්‍යාමි -දිව්‍යාවදානය-) යනුවෙන් ඔහු විසින් පැනවූ රාජ්‍ය නියෝගය ඊට කදිම නිදසුනකි. මෙම සාධකයන්ට අමතර ව බෞද්ධ සංස්කෘතික උරුමයන් ඉලක්ක කරගනිමින් ධර්මාශෝක අධිරාජ්‍යයා විසින් ඉදිකරවන ලද සුප්‍රකට කුක්කුටාරාම මහා විහාරය වැනි විහාරස්ථාන විනාශ කරමින් සමස්ත භාරතීය බෞද්ධ සංස්කෘතියම බිඳ වැට්ටවීමට කටයුතු කර තිබේ.

දිව්‍යාවදානය වැනි ප්‍රමුඛ සාහිත්‍ය මූලාශ්‍රයන්හි දැක්වෙන ඓතිහාසික තොරතුරු සූක්ෂ්ම ලෙස පරීක්ෂා කිරීමේ දී භාරතීය බෞද්ධ සංස්කෘතියේ පරිහානිය කෙරෙහි සෘජු ලෙස වගකිවයුතු තවත් පාලකයින් කිහිපදෙනෙකු පිළිබඳව කරුණු අනාවරණය කරගත හැකි ය. එහි දී මිහිරකුල රජු, ගෞඩ දේශයේ සසංක රජු සහ වෛදික දර්ශනය පෙරදැරි කරගත් කුමාරිලභට්ට ආදීහු බුදුසමය මර්දනය කිරීමෙහි ලා ප්‍රමුඛ භූමිකාවන් නිරූපණය කළහ. මේ අතුරින් කේරළ ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් පාලකයන් ගෙන ගිය කුමාරිලභට්ට රජු එම කලාපයේ වැඩසිටි සියලු ම බෞද්ධ භික්ෂූන් වහන්සේලා බලහත්කාරයෙන් පන්නා දැමීමටත් බෞද්ධ ශාසනික ව්‍යුහය එදෙසින් තුරන් කිරීමටත් කටයුතු කළේ ය. එමෙන් ම බුදුසමයට දැඩි ලෙස ප්‍රතිපක්ෂ වූ ශශංක රජු කුසිනාරාවේ වැඩසිටි භික්ෂූන් වහන්සේලා ඉන් පන්නා දමා එම පූජනීය භූමිය පාළු කිරීමට ක්‍රියා කළේ ය. තව ද කුසිනාරාවේ ඓතිහාසික වශයෙන් මහත් ගෞරවාදරයට පාත්‍ර වෙමින් පැවති බුදුරදුන්ගේ ශ්‍රී පාද ලාංඡනය පවා උගුල්වා දැමූ ඔහු එය නැවත කිසිදිනෙක ප්‍රකෘති තත්ත්වයට පත් කළ නොහැකි වන සේ ගිනි තබා විනාශ කිරීමට තරම් කෲර විය. ඔහුගේ මෙම ආගමික මර්දනකාරී පිළිවෙත තවදුරටත් ව්‍යාප්ත කරමින් බුද්ධගයාවේ මහා බෝධි මණ්ඩපයේ වැඩසිටි බුද්ධ ප්‍රතිමා වහන්සේලා ඉවත් කොට ඒ වෙනුවට ශිව ප්‍රතිමාවක් එහි තැන්පත් කිරීමට ද කටයුතු කර ඇත. මේ කරුණු හරහා පැහැදිලි වන්නේ රාජ්‍ය අනුග්‍රහය සහ ආගමික අන්තවාදය මුසු වූ මෙබඳු විනාශකාරී ක්‍රියාකාරකම් හේතුවෙන් භාරතීය බෞද්ධ සංස්කෘතියේ සහ ශාසනික මධ්‍යස්ථානයන්ගේ පරිහානිය ක්‍රමයෙන් හා වේගයෙන් වර්ධනය වූ බවයි.

භාරතීය බුදුදහම උපන් දේශයෙන් තුරන් වීම කෙරෙහි බාහිර දේශපාලන ආක්‍රමණයන්ගේ බලපෑම ද තීරණාත්මක සාධකයක් ලෙස පෙන්වා දිය හැකි ය. ක්‍රි.ව.

7 වන සියවසේ සිට විවිධ අවධිවල දී ඉන්දියාව ආක්‍රමණය කළ මුස්ලිම්වරුන්ගේ ක්‍රියාකාරිත්වය මෙහි දී ප්‍රබල ලෙස බලපෑවේ ය. ඓතිහාසික සාධකවලට අනුව ක්‍රි.ව. 12 වන ශත වර්ෂය වන විට සමස්ත උතුරු ඉන්දියාවම මුස්ලිම් ආධිපත්‍යයට නතු වූ අතර ආක්‍රමණිකයන් විසින් බලගන්වන ලද දැඩි ඉස්ලාමීය ආගමික ප්‍රතිපත්ති හමුවේ භාරතයේ පැවති බෞද්ධ, හින්දු, ජෛන ආදී සියලු දේශීය ආගම්වල පරිහානිය සිදු වූ බව දක්නට ලැබේ. මෙහි දී මුස්ලිම් ආක්‍රමණ වඩාත් තද බල ලෙස සහ ඍජුවම එල්ල වූයේ බුදුසමයේ ප්‍රධානතම මධ්‍යස්ථාන මෙන් ම බෞද්ධ අධ්‍යාපන පද්ධතියේ කේන්ද්‍රස්ථාන වෙත ය. විශේෂයෙන්ම එකල ජාත්‍යන්තර කීර්තියට පත්ව තිබූ නාලන්දා හා වික්‍රමශීලා වැනි මහා විශ්වවිද්‍යාලයන්හි පැවති පුස්තකාල ගිනිබත් කරමින් එහි වැඩසිටි වියත් භික්ෂු පරපුර ඝාතනය කරමින් ඒවා සම්පූර්ණයෙන් ම භාරතීය පසුබිමෙන් මකා දැමීමට මුස්ලිම්වරුන්ගේ මෙම ආක්‍රමණශීලී ක්‍රියාකාරිත්වය ඉවහල් විය. නායකත්වයක් සැපයීමට සිටි ශාස්ත්‍රවන්ත භික්ෂූන් වහන්සේලා අහිමි වීමත් මහා ආරාම පද්ධතීන් විනාශ වීමත් හේතුවෙන් බුදුදහමට නැවත හිස එසවීමට තිබූ ඉඩකඩ මුළුමනින්ම ඇහිරී ගියේ ය.

**නිගමනය**

යථෝක්ත ඓතිහාසික සාධක දෙස බැලීමේ දී භාරතීය බෞද්ධ සංස්කෘතිය උපන් දේශයෙන් අතුරුදන් වීම කෙරෙහි අභ්‍යන්තර මෙන් ම බාහිර දේශපාලන ක්‍රියාකාරකම් ඍජුවම බලපා ඇත. අශෝක රජුගේ ආගමික සහනශීලී ප්‍රතිපත්තිය තුළින් අන්‍ය ආගම්වලට ලැබුණු දේශපාලනික අවකාශයත් ශුංග, සසංක සහ කුමාරිලභට්ට වැනි පාලකයන්ගේ දේශීය ආගමික මර්දනය හා භික්ෂු සංහාර හේතුවෙනුත් බුදුසමයේ පදනම අභ්‍යන්තරයෙන් දෙදරුණි. එමෙන් ම ක්‍රි.ව. 7 වන සියවසේ සිට ඇරඹි මුස්ලිම් ආක්‍රමණයන් මගින් නාලන්දා සහ වික්‍රමශීලා වැනි මහා ශාස්ත්‍රීය කේන්ද්‍රස්ථාන විනාශ කිරීම ඊට එල්ල වූ මාරක ප්‍රහාරය විය. මෙම රාජ්‍ය ප්‍රතිපත්තීන් හා ආක්‍රමණවල ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස 12 වන සියවස වන විට බුදුසමය එහි මව්බිමෙන් මුළුමනින්ම තුරන් වූ බව පෙනේ.

**ප්‍රමුඛ පද** - දේශපාලනික සාධක, බෞද්ධ සංස්කෘතියේ පරිහානිය, භාරතීය බුදුසමය, මුස්ලිම් ආක්‍රමණ, රාජ්‍ය ප්‍රතිපත්තීන්

**ආශ්‍රිත ග්‍රන්ථ**

සාසනරතන හිමි, මොරටුවේ, (1962). *ලක්දිව මහායාන අදහස්*, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ධම්මතිලක හිමි, පැලැන්වත්තේ, (2012). *ඉන්දියාවේ බුදුසමයේ ඉතිහාසය*, කොළඹ: ඇස් ගොඩ ගිය සහ සහෝදරයෝ.

ගුණසේකර පද්මා (පරි), (2006). *දෙදහස් පන්සිය වසරක බොදු සමය*, නුගේගොඩ: තරංගි ප්‍රින්ටර්ස්.

ඉලංගසිංහ, මංගල, (1997). *ආසියාවේ බෞද්ධ ඉතිහාසය*, කර්තෘ ප්‍රකාශන.

එලියට්, චාල්ස්, (1967). *හින්දු සමය හා බුදු සමය*, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

බෂාම්. ඒ. එල්. (1962). *අසිරිමත් ඉන්දියාව*, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශය, කොළඹ.

විජේබණ්ඩාර, චන්දිම, මොරටුවගම. එච්. එම්., (1979). *බෞද්ධ ශිෂ්ටාචාරයේ ඉතිහාසය*, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

විජේසිංහ, ඩබ්.ඒ.ජී. (2018). *බෞද්ධ සංස්කෘතියේ භූගෝලීය ව්‍යාප්තිය.*